(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 436.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4323/'13

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොල්ලිකුලම් - සිලාවතුර මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය බොරලු ලබා ගැනීමට මහා පරිමාණයේ බොරලු කැපීමක් විල්පත්තු ජාතික වනෝද්‍යානයේ, කලාප අංක 4 ට අයත් බොරලුවල ප්‍රදේශයේ සිදු කරන බවත්;

(ii) තන්තිරිමලේ වන අඩවි කාර්යාලයේ අඩවි ආරක්ෂක නිලධාරියාගේ අනුග්‍රහය මේ සඳහා ලැබෙන බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1937 අංක 02 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 3, 5, 6 වගන්ති සියල්ලම ඉහත (අ) (i)හි සඳහන් ක්‍රියාව නිසා උල්ලංඝනය වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මාග ඉංජිනේරු පුද්ගලික සමාගමට ඉහත ප්‍රදේශයේ බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දුන් අය කවුරුන්ද;

(iii) විල්පත්තු ජාතික වනෝද්‍යානයේ පරිසරයට විශාල හානියක් වන එම ක්‍රියාවලිය වහාම නතර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4468/'13

2.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 හා 2012 යන වර්ෂවලදී එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය Cranford Johnson Robinson Wood නමැති සමාගම සමග ගනුදෙනු කර තිබේද;

(ii) එසේ නම්, එම ගනුදෙනු සිදුවී ඇති දින වකවානු කවරේද;

(iii) එම ගනුදෙනු තුළින් ඉටු කර ගෙන ඇති කාර්යය හෝ කාර්යයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රයෝජන කවරේද;

(v) එම කටයුතු වෙනුවෙන් කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

(vi) ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂය කවරේද;

(vii) එම සමාගම සමග ගිවිසුම්වලට එළැඹ ඇත්නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4755/'14

3.

ගරු අශෝක් අබේසිංහ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පොල් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් නිෂ්පාදනය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5112/'14

4.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 සැප්තැම්බර් මස 12 සහ 13 යන දිනයන්හි දී ජාතික විදුලිබල පද්ධතියට එක් කළ විදුලි ඒකක ප්‍රමාණය පැයට කිලෝවොට්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන්, රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 සැප්තැම්බර් 11, 12 සහ 13 යන දිනයන්හි දී ජල විදුලි බලාගාර මගින් උත්පාදනය කර ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇති විදුලි ඒකක (පැයට කිලෝවොට්) සංඛ්‍යාව එක් එක් දිනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් දිනයන්හි දී ජල විදුලි බලාගාර මගින් උත්පාදනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව එකිනෙකට වෙනස් වූයේ නම්, එසේ වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5199/'14

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිම් සවිය වැඩ සටහනේ මූලික පරමාර්ථ කවරේද;

(ii) අධිකරණය මගින් ලබාදුන් තීන්දුවකට පටහැනි ලෙස බිම් සවිය වැඩ සටහන යටතේ ඉඩම් මැනීමක් සිදු කිරීමට හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් මැනීම කවර නීති ප්‍රතිපාදනයක් යටතේ සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හෝමාගම දිසා අධිකරණයේ, නඩු අංක 2061 බෙදුම් නඩුවේ අවසන් තීන්දුව අනුව කොටස් 3කට කැබලි කළ ඉඩමක් එම තීන්දුවට පටහැනිව බිම් සවිය නිලධාරීන් විසින් කොටස් 2කට කැබලි කර ඇති බව දන්නේද;

(ii) එම ඉඩම එසේ බෙදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5420/'14

6.

ගරු අජිත් කුමාර මහතා,— වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, කුඹුක්කන් ඔය හරස් කර අක්කර 800ක ජලාශයක් ඉදිකිරීමට කටයුතු යොදා ඇති බවත්;

(ii) එම ජලාශය ඉදිකිරීම හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්මිරිස් හා රබර් වගාවට දැවැන්ත බලපෑමක් සිදු වන බවත්;

(iii) එම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය ඇන හිටින බවත්;

(iv) ජලාශය ඉදිකිරීම නිසා ප්‍රදේශයේ දැවැන්ත වන හානියක් හා පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජල යෝජනාක්‍රමයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කවරේද;

(ii) එම ජලාශය ඉදිකිරීමෙන් ලබා කර ගැනීමට අපේක්ෂිත සංවර්ධනය කවරේද;

(iii) මෙම යෝජනාක්‍රමය සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5657/'14

7.

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛනයේ 'අ' පරිශිෂ්ටයේ සඳහන් ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළවන තනතුරුවලින් දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ලැයිස්තුවේ සඳහන් ඉහත ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවල පත්කිරීම් බලධරයා කවුරුන්ද;

(iii) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීමේ පටිපාටිය කවරේද;

(iv) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා මේ වන විට පත්කර ඇති ශ්‍රී.ලං.ප.සේ. නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) 2012.07.02 දින සිට 2014.01.01 දින දක්වා වූ කාලය තුළ පුරප්පාඩු වී තිබූ ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරු පැවති ආයතන, එම තනතුරු නාම සහ තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා 2014 අගෝස්තු මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද, සුදුසුකම් සම්පූර්ණ කර තිබූ එක් එක් නිලධාරියාගේ නම, ඔවුන් ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියට පත් වූ දිනය, පශ්චාත් උපාධිය වලංගු දිනය, එම උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය හා එම උපාධියේ විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4405/’13

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2013 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පොල් පරිභෝජනය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාල සීමාව තුළදී අපනයනය හා ආනයනය කරන ලද පොල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන අපනයනය ඉලක්ක කර ගත් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් කවරේද;

(iii) එම එක් එක් නිෂ්පාදනයන්ගෙන් වාර්ෂිකව අපනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් කාල සීමාව තුළදී පොල් වතුර අපනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම පොල් වතුර අපනයනය කර ඇත්තේ පොල් වතුර ස්වරූපයෙන්ද; නැතහොත්, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදනයන් වශයෙන්ද;

(iii) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කළ රටවල් කවරේද;

(iv) එම අපනයනයන්ගේ ප්‍රමාණය කොපමණද;

(v) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් ලැබූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ පොල් නිෂ්පාදනය ආරම්භ කරන්නෙකු සඳහා රජය මගින් ලබා දිය හැකි සහන කවරේද;

(ii) එම සහන ලබා ගැනීම සඳහා නිෂ්පාදකයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4573/’13

9\.

ගරු අනුර දිසානායක මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් වාර්ෂිකව අවශ්‍යවන දියර කිරි ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනික කිරිපිටි කිලෝග්‍රෑම් 01ක් වෙනුවෙන් අය කරනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල, ආනයනික කිරිපිටි දේශීය වෙළඳපොළේ අලෙවි කරනු ලබන මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4771/'14

10\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ දැනට ධාවනය වන මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි සේවය කරන අතිරික්ත රියැදුරන් හා කොන්දොස්තරවරුන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(iii) අතිරික්ත රියැදුරන් හා කොන්දොස්තරවරුන්ගේ සංඛ්‍යාවට සරිලන පරිදි බස් රථ ගෙන්වීමට කටයුතු කරන්නේද;

(iv) අයවැයෙන් ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5113/'14

11\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා, 2014. 01. 01 දින සිට ක්‍රියාත්මක වූ වැඩි වූ බදු ප්‍රතිශතය කොපමණද;

(ii) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහා මෙම බදු වැඩි වීම ක්‍රියාත්මක කිරීමේදී ගොවි ජනතාවට හෝ රටට සිදුවේයැයි බලාපොරොත්තු වන යහපත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012, 2013 වර්ෂවලදී සහ 2014 වර්ෂයේ අප්‍රේල් මස අවසානය දක්වා ලියාපදිංචි කර ඇති රෝද හතරේ නව කෘෂිකාර්මික ට්‍රැක්ටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සඳහාවන බදු වැඩි කිරීම තුළින් ගොවි ජනතාවට සහ කෘෂිකර්මාන්තයට අයහපත් බලපෑමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, එම අහිතකර බලපෑම වැළැක්වීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5202/'14

12\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ සේවයේ නියුතු මුස්ලිම් ආගමික බැතිමතුන් උම්රා සහ හජ් ආගමික වන්දනාව සඳහා විදේශගත වීම සඳහා අවසර ලබා ගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(ii) අදාළ පුද්ගලයා ගුරුවරයකු වන විට, ඔහුට එම වන්දනා ගමන සඳහා වැටුප් සහිත නිවාඩු හිමි වන්නේද;

(iii) උම්රා වන්දනාව සහ හජ් වන්දනාව සඳහා විදේශගත වන අය සඳහා සරල අයදුම්පත් හා වීසා ලබාදීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා මැදිහත්වීමක් සිදු කරන්නේද;

(v) ඉහත වන්දනා චාරිකාවේ යෙදෙන රජයේ සේවකයින් සඳහා අනුමත කරන නිවාඩු දින ගණන කොපමණද;

(vi) එම දින ගණන ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4473/'13

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර, උයන්වත්ත ක්‍රීඩාංගනය දිස්ත්‍රික් සහ සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීමට යොදා ගන්නා පොදු ක්‍රීඩාංගණයක් බවත්;

(ii) මාතර නගරවාසීන් බොහෝ පිරිසක් දෛනිකව ශාරීරික සුවතා සඳහා එම ක්‍රීඩාංගණය භාවිතා කරන බවත්;

(iii) මාතර මහ නගර සභාව මගින් එම ක්‍රීඩාංගණය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකිණීම සඳහා කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකුණනු ලැබුවහොත්, එම ප්‍රදේශයේ ජනතාවට අපහසුතා රැසකට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී ක්‍රීඩාංගනය විකිණීමේ ක්‍රියාවලිය නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4580/'13

14.

ගරු අනුර දිසානායක මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් එවකට පැවති ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් ආයතන විසින් දරන ලද මුළු වියදම් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) එම මුදල් වැය කරන ලද ආකාරය කවරේද;

(iv) එම සමුළුවේ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දැරූ වියදම කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතු ලබා දුන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය කවරේද;

(vi) එම එක් එක් මාධ්‍ය ආයතනය වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සහ පෞද්ගලික බස් රථ සඳහා ඒකාබද්ධ කාල සටහන් ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව පෞද්ගලික බස් රථ සංඛ්‍යාවට වඩා අඩු බැවින් එම ඒකාබද්ධ කාල සටහන් ක්‍රමය මගින් බරපතල අලාභයක් ශ්‍රී ලංගමයට සිදුවන්නේද;

(iii) එසේ නම්, ශ්‍රී ලංගමයට සිදුවන එම අලාභය වළක්වා ගැනීම සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2011.04.07 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 8.30 දක්වා විය යුතුය. අ. භා. 7.30 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— එක්සත් ජාතීන්ගේ පනත යටතේ නියෝග,— 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*5.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*11.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---